

# වර්ෂා - නික්ම ගිය බෝනික්කී

**වර්ෂා වැනි ළදැරියන් ගොදුරුට ගන්නා වෘකයන්, ගිනි පිඹින මකරුන් සහ රුධිර පිපාසිත පිශාචයින් මෙලොව ඉන්නා බව මාෂා තවමත් නොදන්නීය. ඈ කිසිදු සැකයකින් තොරව තවමත් හිනැහෙන්නේ එනිසාවෙනි. එහෙත්, ඈ දිනෙක ඒ දැන ගනු ඇත. රෙඩ් රයිඩිං හුඩ් කතාව කියා දෙන්නටත් පළමුව- ඔව්, කල් නොයවාම ඈ සංවිධානාත්මක ලෙස මිනිසුන් ගිලින වෘකයන් ගැන දැන ගනු ඇත.**

ලෝදිය උතුරන
මේ මහ පොළවට
පුංචි දිය බිඳකි - වර්ෂා

අග්නි පිපාසිත
උඩු සුළඟේ වැද
කොහි ගියාද නුඹ - වර්ෂා

ආයෙත් නම් මේ
කාෂ්ඨ පොළවට
වහින්නෙපා නුඹ - වර්ෂා

නුඹට ලොවක් නැති
අපට උරුම නැති
සිහිනයක්ය නුඹ - වර්ෂා

රුහිරු පොළව මත
කාසි මල් පිපෙයි
හන්නෙපා නුඹ - වර්ෂා

සූර්ය සප්තකය
යුගාන්ත ගිර මත
නැග එනවා දුව - වර්ෂා

වළාකුළක නුඹෙ
පුංචි හිස හොවා
මුවා වෙන්න නුඹ - වර්ෂා

සඳ මඬලට නැග
කිරි සයුරේ නුඹෙ
දෙපා පොඩි දොවන් - වර්ෂා

තඳුළු උනන්නැති
අපේ ඇස්වලට
පෙනෙන්නෙපා නුඹ - වර්ෂා[1]

වර්ෂා[2] යළි නොඑන්නටම නික්මී ගියාය. සියොළඟෙහිම විෂ ඇති අමන දූදනන් විසින් හප කරන ලදුව, හුස්ම අහවර වී ඈ නික්මී ගියාය. කුටියෙහි සයනය මත හිස්තැනක් තබා, අම්මාට අප්පාට නිදි වර්ජිත රාත්‍රීන් පමණක් ඉතුරු කොට ඈ යන්නට ගියාය.

ඔවුහු, බෝනික්කිය වළලා දමා හිස් වූ නිවසට එන්නට ඇත. හය වසරක් ලෙහි හොවා වැඩූ බෝනික්කිය අඳුරු සොහොනක තනි කොට, හඬන්නට කඳුළු ඉතිරි නොවූ වියැළුනු ඇස් වලින් යුතුව එන්නට ඇත. මම රත්න ශ්‍රීගේ සදාකාලික කවිය ඇතුළේ නිදන බෝනික්කා සහ වර්ෂා සමාන කරන්නට දුබල උත්සාහයක නියැලෙමි.

රන් සිවි ගෙය තනා රුවට
සතපා එහි මිය ගිය ඇය
ගෙන ගියෙමුව සොහොන් බිමට,
අපේ ළඟ ම ළඟ නෑයා
මිය ගිය බෝනික්කා
මිහිදන් කළෙමු ව එදවස.[3]

මතුපිට අරුතෙන් ගත් විට සදාකාලික කවිය, දරුවන් පිරිසක් විසින් සෙල්ලම් බෝනික්කෙකු වළ දැමූ හැටි කියන කවියකි. එහෙත්, එය අකලට මිය ගොස් මිහිදන් වෙන සියළු දරුවන් වෙනුවෙන් ලියන ලද කවියකැයි සිතන්නට මා කැමතිය. අප මේ ගත කරමින් ඉන්නා මොහොතේත් ලෝ පුරා දරුවෝ මිය යති. නො එසේනම්, යුද්ධයේ හෝ එහිම ඵලය වූ කුසගින්නේ ගොදුරු බවට පත්ව වේදනා විඳිමින් පණ පිටින් මිය යමින් හිඳිති. ගාසාවේ හෝ සුඩානයේ හෝ මුලතිව්වල හෝ මිය යන බෝනික්කන් වළ දැමෙන්නේ ද මෙයට වෙනස් අන්දමකට නොවේ. මරණ වර්ග කරන පාහරයන් හිතා මතාම අමතක කොට දමන සත්‍යය එයයි.

අන්තර්ජාලයේ වැටී තිබී අහුලා ගත් වර්ෂාගේ සේයාරුව දෙස මම යළිත් බැලුවෙමි. ඈ බෝනික්කියකි. සසලවන ඇසිපිය ඇති, නිලනා පළිඟු නෙත් ඇති බෝනික්කියකි. නොඑසේනම් රෝස මලකි. පිපෙන්නට නොදී නටුවෙන් උගුල්ලා තලා පොඩි කර දැමූ රෝස මලකි. පස් යට සැඟවෙන්නේ නිසල කළ ඇසිපිය ඇති බෝනික්කන් ය. රෝස පැහැය ලේ පැහැයට හරවා මරා දැමුණු රෝස මල්ය. එහෙයින්, ඉතිරි වී ඇති රෝස මල් වලින් නොපිපී සැඟවෙන්නැයි ඉල්ලා සිටිමුද?

රෝස මල් නොපිපෙන්න හිස සඟව සැඟවෙන්න
පෙති හකුල ලතැවෙන්න කටු තුඩුම පොපියන්න
නටු බඳේ කටු ඇන්න
බඹරුන් ද සිත් තැවුන

වෙඩි මුසුව මද නලට
මළ බෙර වයන කොවුල් නද

දැතින්ම පස පෙරළ
රෝස මල් වලලන්න...[4]

වර්ෂා නික්මුණු පුවත ඇති පත්තර කොළය ළඟ මාෂා[5] හයියෙන් හුස්ම ගනිමින් නිදා සිටින්නීය. සුභාෂිතයේ එන "නපුරු දුදනන්ගේ" කවිය ගැන මිය ගිය වර්ෂා දැන සිටි ඇබින්දවත් මාෂා දන්නේ නැත. ඈ අප නොදන්නා ලෝකයක ඉන්නා සුරංගනාවියක සමග සිහිනෙන් හිනැහෙන්නීය.

අදින් මාස පහකට පෙර, මාෂා එලොව සිට මෙලොවට එද්දී ශල්‍යාගාරයේ සිට බලා සිටියෙමි. ගැබ පළා අම්මා සමග එතෙක් බැඳී සිටි රැහැනෙන් මුදා, වෛද්‍යවරු මාෂාව මේ ලෝකයට ඇද ගන්නා හැටි විස්තර කළ නොහැකි හැඟීමකින් බලා සිටියෙමි. පළමු හුස්මත් සමග ඈ හඬන්නට වූවාය. ඉන් පසු මාෂා අම්මාගෙන් කිරි බොන්නට වූවාය. ජීවිතයක පටන් ගැන්ම එපරිදිය.

වර්ෂා වැනි ළදැරියන් ගොදුරුට ගන්නා වෘකයන්, ගිනි පිඹින මකරුන් සහ රුධිර පිපාසිත පිශාචයින් මෙලොව ඉන්නා බව මාෂා තවමත් නොදන්නීය. ඈ කිසිදු සැකයකින් තොරව තවමත් හිනැහෙන්නේ එනිසාවෙනි. එහෙත්, ඈ දිනෙක ඒ දැන ගනු ඇත. රෙඩ් රයිඩිං හුඩ් කතාව කියා දෙන්නටත් පළමුව- ඔව්, කල් නොයවාම ඈ සංවිධානාත්මක ලෙස මිනිසුන්

මුතු කරාබුව

ගිලින වෘකයන් ගැන දැන ගනු ඇත. එසේ මිනිසුන් ගිලින වෘකයන් පිච්ච මල් වතුරෙන් සෝදා තමන්ගේ බල අවශ්‍යතා වෙනුවෙන් සුදු පිළි අන්දවා කැමරා ඉදිරියට ගෙන එන බඩගිනි සිංහයන් ගැන ඈ දැන ගනු ඇත. සිංහයන් මස් අනුභව කොට වීසි කරන කටු ලෙව කා දිවි සරි කර ගන්නා පත්තරකාර හිවලුන් ගැන ඈ දැන ගනු ඇත.

දැන්, ආයෙමත් සදාකාලික කවියට යමු. කාලයකට පසු එක්තරා දිනෙක, බුල්ඩෝසර් පැමිණ සොහොන් බිම පස් පෙරළන්නට විය. බෝනික්කා නිදා හිටි තැනින් උඩට මතු වූවාය. ඉන් පසු රත්න ශ්‍රී ලියන්නේ වර්ෂලා බඳු සැඟව ගිය බෝනික්කන් ගැන අප සිත් හී ඇති අවිඥානික ප්‍රාර්ථනය යි. කරුණාකර, කියවා හඬන්නැයි මම ඔබට යෝජනා කරමි.*

රන් සිවි ගෙය නොවිණ
සුදු සැරසිලි ද නොවිණ
ඈ සිටියා නිදා පිබිද
එදා වගෙම

සසලවන ඇසිපිය
නිලනා පළිඟු නෙත් යුග
රැළි ගැසුණු කෙහෙ රන්වන
මඳ සිනා ගෑ ලවනත
කිසිදාක මිය නොගිය
සදාකාලික කවිය
බෝනික්කෝ නුඹය.[3]

1. වර්ෂා- අජිත් පැරකුම් ජයසිංහ
2. ත්‍රි'මලයේදී කප්පම් කල්ලියක් විසින් ඝාතනය කරන ලද ජූඩ් රෙජී වර්ෂා දියණිය
3. සදාකාලික කවිය- මධ්‍යම යාමය. රත්න ශ්‍රී විජේසිංහ
4. වරදින හැම ඉලක්කයක්ම රෝස මලකි - ඊ.ඒ. ඩෝසන් ප්‍රීති
5. කුඹී පැටියා

තරංග ජයසේන
www.boondi.lk

*ප.ලි. ★ කවි කියවා හඬනවාට වඩා බොහෝ වැදගත් වැඩ ඔබට තිබෙන්නට පුළුවන. එහෙත්, බොනික්කන් දඩයම් කරන වෘකයා සැඟව සිටින්නේ ද කවි නොකියවන ඇහැට කඳුළු නොඑන, එහෙත් වෙනත් බොහෝ වැදගත් වැඩ ඇති ඔබ බඳුම වූ අය තුළය. ඒ වෘකයා දඩයම් කිරීම ඔබම කළ යුතුය.*




